# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්

[ සිංහල – Sinhala – سنهالي ]

අබූ ෆාත්මා

2015 - 1436

IslamHouse.com

# "سوناغر"

# المسلمون السريلانكيون

« باللغة السنهالية»

أبو فاطمة

2015 - 1436

IslamHouse.com

# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්-9

# ‘සෝනහර්’

## (එම්. ජේ. වංශ අච්මඩ් විසින් 1937 ජනවාරි 22 වන දින ‘ටයිම්ස් ඔෆ් සිලෝන්’ පුවත්පතට සැපයූ ලිපියක්)

යෝනකවරුන් හැඳින්වීම සඳහා යෙදෙන “මූවර්” යන වචනය “මෝරෝ” යන ස්පාඤ්ඤ වචනයෙන් සහ “මොවුරෝ” යන පෘතුගීසි වචනයෙන් බිඳී ආවකි. එහි අර්ථය වර්තමාන මොරොක්කෝව වන මොරිටානියාවේ වැසියන් යන්නය. අරාබි ජාතිකයින් ද ආසියාවේ හා අප්‍රිකාවේ වෙළඳුන් වශයෙන් පැලපදියම් වූ අරාබි ජාතිකයන්ගෙන් පැවත එන්නවුන් ද හැඳින්වීම සඳහා පෘතුගීසීන් විසින් මේ පදය කිසිදු විචාරයකින් තොරව භාවිත කළහ.

පෘතුගීසීන් ලංකාවට පැමිණීමට පෙර මුස්ලිම්වරු හෝ මේ රටේ යෝනකවරු “යොන්” නැතහොත් “යොන්නු” යනුවෙන් සිංහලෙන් ද “සෝනහර්” යනුවෙන් දෙමළෙන් ද හඳුන්වනු ලැබූහ. “යොන්” හෝ “යොන්නු” යන පද පාලි “යානා” සහ

සංස්කෘත "යවන" යන පද වලින් බිඳී ආ බව පෙනේ. ඒ පද වල අර්ථය විදේශිකයා විශේෂයෙන් ම අරාබි ජාතිකයා යන්නයි. මේ ක්‍රමය අනුගමනය කරමින් පුරාණ සිංහල මිනිසුන් විසින් මේ රටේ අරාබි ජාතිකයන් සහ ඔවුන්ගෙන් පැවත එන්නන් "යොන්" හෝ "යොන්නු" යනුවෙන් හඳුන්වනු ලැබූහ.

'යොන්' යන පදය මෙකී මනුෂ්‍ය වර්ගයා හැඳින්වීමට භාවිත කළ බවට උදාහරණ ලෙස 'යොන් වීදිය' 'යොන් ගල' 'යොන් බිසව' යන ස්ථාන නාම සහ පුද්ගල නාම සාක්ෂි දරයි. කෙසේ වුව ද 'යොන්' යන පදය දැන් ලිඛිත භාෂාවේ දී පමණක් භාවිත වන අතර සිංහල හසුරුවන්නන් විසින් ව්‍යවහාරයේ දී භාවිත කරනු ලබන්නේ 'මරක්කල' හෝ 'මරක්කලයින්' යන වදන් ය.

## ගෞරව නම්බු නාමයක්

මේ වදන බිඳී ආයේ මලබාරයේ උසස් මුස්ලිම්වරුන් හැඳින්වීමට භාවිත කරන ලද ගෞරවාර්ථ පදයක් වූ 'මර්කාර්' යන පදයෙනි. ලංකාවට පෘතුගීසීන්ගේ ගොඩ බැසීමට විරුද්ධ ව සටන් කිරීම සඳහා මලබාර් යුද්ධ හමුදාවක සේනාධිපති වශයෙන් පැමිණි යෝනක ජාතික අලි ඉබ්‍රාහිම් මර්කාර් මේ දිවයිනට පැමිණීමෙන් පසු මේ පදය ව්‍යවහාරයට පැමිණියේ යැයි සලකනු ලැබේ. අනෙක් අතට

'මරක්කල' යන යෙදුමට අරාබි ප්‍රභවයක් ද ඇති බව පෙනේ. දකුණු ඉන්දියාවේ සහ ලංකාවේ වෙළඳාමෙහි යෙදුණු අරාබි ජාතිකයින් නැවියන් හා නෞකාධිපතීන් ද වූ හෙයින් නැව යන අර්ථවත් 'මර්කබ්' යන පදයෙන් බිඳී නාවිකයා හෝ නෞකාධිපති හැඳින්වීමට 'මර්කාබි' යන පදය භාවිත කරන ලදී.

යෝනක ජනයා තමන් හැඳින්වීම පිණිස භාවිත කරනු ලබන 'සෝනහර්' යන දෙමළ වචනය බිහි වූ ආකාරය රොට්ලර් විස්තර කරන්නේ මෙසේය. පුරාණ හින්දු භූගෝල විද්‍යාඥයින් අරාබිය හඳුන්වන ලද්දේ 'නොනහාම්' යනුවෙනි. මේ අනුව සෝනහර් යන්නෙන් අරාබි ජාතිකයෙකු නැතහොත් 'සොනහාම්' රටේ රට වැසියෙක් අදහස් කෙරිණි. කල් යත්ම සෝනහර් යන නාමය මේ රටේ අරාබි ජාතිකයින්ගෙන් පැවත එන්නන් සඳහා භාවිත වන්නට විය.

වාණිජ කටයුතු සඳහා මෙරටට පැමිණි අරාබි ජාතිකයින්ට අමතර ව හාෂිම් පෙළපතට එරෙහි වූ ඔමය්යාඩ් කාලිෆ් (පාලකයා) අබ්දුල් මලික් ඉබ්න් මර්වාන් නමැති කාලිෆ් රජු විසින් රටින් පිටුවහල් කරන ලද හාෂිම් පෙළපතේ අරාබි මිනිසුන් කණ්ඩායමක් ද ක්‍රි. ව. අට වන ශත වර්ෂයේ දී ලංකාව ඔවුන්ගේ ක්ෂේම භූමිය කර ගත්හ. ලංකාවේ අද සිටින ඇතැම් මවුලානා පවුල් පැවතෙන්නේ මේ

හාෂිම්වරුන් ගෙන් බව කියනු ලැබේ. මේ අරාබි ජන දෙකොට්ඨාසය අද සිටින ලංකා යෝනක වරුන්ගේ මුතුන්මිත්තන් ය.

## ලංකාවේ මුස්ලිම් රජු

යෝනක ජනයාගේ ඉතිහාසය හාරා අවුස්සා බැලීමේ දී එක් කලෙක ලංකාවේ කිරීටය මුස්ලිම් රජෙකු විසින් දරන ලද බව අනාවරණය වේ. මොහු වූ කලි කුරුණෑගල රාජධානිය කොට ගත් වතීම් (වස්තුමනි) දෙවන බුවනෙකබාහු රජුගේ යෝනක බිසවක් වූ 'යොන් බිසව' යනුවෙන් හඳුන්වන ලද බිසවගේ පුත්‍රයාය.

ක්‍රමක්‍රමයෙන් ලංකාව යෝනක ජනයාගේ නිජ බිම බවට පත් විය. කල් යාමේදී ඔවුහු ලංකා ඉතිහාසයේ වැදගත් කාර්යභාරයක් ඉටු කළහ. ලංකාවේ පදිංචි වූ මුල් යෝනක ජනයා අරාබියේ සිටි තම සහෝදර ජනයා සමග නිතර සම්බන්ධතා ඇති කර ගෙන තිබුණු නමුත් පෘතුගීසීන්ගේ සහ ඔවුන්ගෙන් පසු ලන්දේසීන්ගේ කඩාවැදීමෙන් පසු යෝනකවරුන් පීඩිත ජනකොටසක් බවට පත් වූ අතර ඔවුන්ට අතවර සහ හිංසා පීඩා කොට ඔවුන්ගේ විදේශීය වෙළඳාම උදුරා ගෙන ඔවුන්ගේ දේශපාලන අයිතිවාසිකම් ද ඔවුන්ට අහිමි කරන ලදී. ඉංග්‍රීසීන් ලංකාවට පැමිණෙන තෙක් ම මේ ඛේදජනක තත්ත්වය එසේම පැවතිණි. මේ දුක් බරින්

මිරිකෙමින් සිටි යෝනක ජනයාගේ උනන්දු ව හීන වී ඔවුන් අලසයන් බවට පත් වූ නමුත් විවිධ වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් රටේ අභ්‍යන්තර වෙළඳාම ඔවුන් විසින් කර ගෙන යන ලදී. මේ ආකාරයෙන් ඔහු මේ රටේ වෙළඳාමේ පුරෝගාමිකයන් සහ දක්ෂ ව්‍යාපාරිකයන් බවට පත් වූහ.

වර්තමාන යෝනක ජනයා මෙන් නොව පෙර කල යෝනක ජනයා රණකාමී පිරිසක් ද වූහ. මුල දී පෘතුගීසීන්ට විරුද්ධ ව සටන් කළ මොවුහු පසුව කන්ද උඩරට සහ ඉංග්‍රීසීන් අතර සිදු වූ යුද්ධ වලදී ක්‍රියාකාරී කොටසක් ඉටු කළහ. ඔවුන් අතර දක්ෂ වෛද්‍යවරුන් සිටි අතර සිංහල රජවරුන්ට සේවය කළ හකීම්වරු (පාරම්පරික වෛද්‍ය විද්‍යාවේ නිපුණත්වයක් ලද පිරිස) ද ඒ අතර වූහ. වර්තමාන යෝනක වෛද්‍යවරුන්ගෙන් ඇතැමෙක් මෙකී පුරාණ වෛද්‍යවරුන්ගේ පරම්පරා වලින් පැවත එන්නෝ වෙති. සිංහල රජෙකුගේ අමාත්‍යවරුන් වශයෙන් යෝනක ජාතිකයින් සිව් දෙනෙකු සිටි බව ද කියනු ලැබේ.

## සාමකාමී පිරිසක්

බ්‍රිතාන්‍යයන් ලංකාවට පැමිණි තෙක් සිට ලංකාවේ අනෙකුත් ජන කොටස් සමග සමසේ නිදහස භුක්ති විඳින යෝනක ජනතාව අද අප දන්නා පරිද්දෙන් බ්‍රිතාන්‍ය රජුගේ නීතිගරුක හා සාමකාමී

පුරවැසියයෝ වෙති (මෙම ලිපිය සකස් කර ඇත්තේ ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් අ පැවති කාලයේ ය). ඔවුහු රටේ අනෙකුත් ජනයා සමග මිත්‍රත්වයෙන් ජීවත් වෙති.

අරාබි ජාතිකයින්ගේ ආවේණික ආගන්තුක සත්කාර ගති පැවතුම් ලංකා යෝනක ජනයා තුළ විද්‍යාමාන වූයෙන් අමුත්තෙකුට දැක්විය යුතු කාරුණික හා ශිෂ්ට සම්පන්න සංග්‍රහ ගැන ඔවුහු විශේෂයෙන් සැලකිලිමත් වෙති. ඔවුන්ගේ ආගන්තුක සත්කාර ප්‍රතිපත්තිය ඉතා පැහැදිලි ව දක්නට ලැබෙන අවස්ථා ලෙස ආගමික හා මංගල උත්සව දැක්විය හැක. මේ උත්සව වලදී අමුත්තන්ට ඉතා ප්‍රණීත ආහාරපාන වලින් සංග්‍රහ කරනු ලැබුහ. ව්‍යාපාර කටයුතු වලදී සහ තමන්ගේ ශුභ සිද්ධියට අදාළ සියලු ප්‍රයත්නයන්හි දී පරීක්ෂාකාරී සහ විචක්ෂණ ලෙස කටයුතු කරන මේ යෝනක ජනයා වෙළඳ ව්‍යාපාරයන්හි දී කඩිසරවත් නොපසුබටවත් ක්‍රියා කරති. වාණිජ කටයුතු වල පුරෝගාමීන් වූ මොවුහු ලංකාවේ ධෛර්ය සම්පන්න ජන කොට්ඨාසයක් වෙති. භක්තිමත් මුස්ලිම්වරුන් වීමට ඔවුන්ට ඉස්ලාම් දහම පිහිට වී ඇත්තාක් මෙන් ම ඉතා වැදගත් ජන කොට්ඨාසයක් ලෙසට උසස් තැනක් ගැනීමට හා එය රැක ගැනීමට ඔවුන්ට පිහිට වී ඇත්තේ වෙළඳාම හා වාණිජ කටයුතු ය.

# යෝනක ජනයා සමාජයේ සෑම තරාතිරමක ම සිටින බව

යෝනක ජනයා සෑම තරාතිරමක ම දක්නට ලැබේ. දැනට ඔවුන්ගෙන් ස්වල්ප දෙනෙක් රජයේ උසස් තනතුරු දරන නමුත් අතීතයේ දී බොහෝ යෝනකවරු එවැනි උසස් තනතුරු දැරූහ. ලංකාවේ විශිෂ්ට ගෘහ නිර්මාණ ශිල්පීන්ගෙන් බොහෝ දෙනා යෝනකවරුන් වන අතර කොළඹ සහ අනෙකුත් ප්‍රදේශ වල පිහිටි විශාල ගොඩනැගිලි සමහරක් ඊට සාක්ෂි දරයි. ලංකාවේ සිටින විශිෂ්ටතම මැණික් වෙළඳුන් සහ ස්වර්ණාභරණ වෙළඳුන් යෝනකවරුන් වන අතර ඔවුන් අතර වෙළඳ ලෝකයේ පතාක යෝධයෝ සිටිති. මේ හැරෙන්නට දක්ෂ වෛද්‍යවරු සුප්‍රකට නීතිවේදීහු හා දේශපාලඥයෝ ද ඔවුන් අතර වෙති.

බොහෝ කලක් නොසලකා හැර තිබුණු අධ්‍යාපනය සඳහා විශාල අවධානයක් පසුගිය වර්ෂ විසි පහ තුළ දී යෝනක ජනයා විසින් දක්වන ලදී.